# ලංසු සඳහා ආරාධනය

## උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත

1. උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කොට්ඨාසවලට අයත් මාර්ගවල නඩත්තු සහ සේවා කටයුතු සඳහා පහත සඳහන් කාණ්ඩයන් යටතේ කියුබ් 3 ටිපර් රථ 4ක් කුලී පදනම මත සපයා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු කැඳවීම (NCB) යටතේ සිදු කරනු ලැබේ.

| අනු අංකය | විස්තරය | කොන්ත්‍රාත් කාලසීමාව (අවු.) | ටිපර් රථ 1 ක් සඳහා ලංසු සුරක්ෂණය | | ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|
| | | | වටිනාකම (රුපියල්) | වලංගු විය යුතු කාලසීමාව | |
| 01 | කියුබ් 3 ටිපර් රථ 4ක් කුලී පදනම මත සැපයීම | 1 | 63,000.00 | 2026/08/17 | 2,250.00 |

2. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු අසාධු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඌන කාර්ය සාධනය හේතු කොට ගෙන මීට පෙර ගිවිසුම අවසන් කරන ලද සැපයුම්කරුවෙකු නොවිය යුතුය. (Should not be Terminated due to the poor performance).
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසු ලේඛනයෙහි V පරිච්ඡේදයේ (section v) සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.
4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය උ.මැ.ප, අනුරාධපුර. (දු.ක. 025-2222505) වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර, ගාස්තු ගෙවීමකින් තොරව එම කාර්යාලයේදී 2026.05.14 වන දින සිට 2026.05.29 වන දින දක්වා වැඩ කරන දිනවල දී පෙ.ව.9.00 ත් ප.ව.3.00 ත් අතර, ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.
5. ඉහත වගුවේ සඳහන් ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය උ.මැ,ප, අනුරාධපුර ගිණුම් අංශයට ගෙවීමෙන් හෝ ලංකා බැංකුව අනුරාධපුර ශාඛාවේ "සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය" නමින් ඇති නිල බැංකු ගිණුම් අංක 0001472049 දරන ගිණුමට බැර කර තැන්පතු පත්‍රිකාව උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026.05.14 වන දින සිට 2026.05.29 වන දින දක්වා වැඩ කරන දිනවල දී පෙ.ව.9.00ත් ප.ව.3.00ත් අතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබා ගත හැකිය.
6. ලංසු ඉදිරිපත් කිරීමේදී සෑම ලංසුවක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන් වෙන්ව කවරවල බහා නැවත එම කවර දෙකම එක් කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවර ව්‍යාපෘතියේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර 2026.06.01 වන දින ප.ව. 2.00 ට පෙර "සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය(උ. මැ.ප.),එච්. බී. සේමසිංහ මාවත, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකිය. 2026.06.01 වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ විගසම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. සෑම ලංසුවක් සමගම එක් එක් වාහනයට/යන්ත්‍රයට අදාළව ඉහත වගුවේ සඳහන් වටිනාකමට අනුකූලව මුළු වාහන/ යන්ත්‍ර සංඛ්‍යාවට සරිලන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් "සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය" නමින් ප්‍රසම්පාදන ලේඛනවල අන්තර්ගත ආකෘතිය අනුව පමණක් ලබා ගත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති නම් ලංකා බැංකුව අනුරාධපුර ශාඛාවේ, "සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය" නමින් ඇති නිල බැංකු ගිණුම් අංක 0001472049 දරන ගිණුමට ලංසු සුරක්ෂණයේ වටිනාකම බැර කර තැන්පතු පත්‍රිකාව උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා එන්.සී 100 කුවිතාන්සියේ මුල් පිටපත ප්‍රසම්පාදන ලේඛනයට අමුණා ඉදිරිපත් කළ යුතුය. නොඑසේ නම් අදාළ මුදල් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් අංශය වෙත භාරදී ලබාගත් ලදු පතේ මුල්පිටපත සමග අමුණා ඉදිරිපත් කළ යුතුයි. ලංසු සුරක්ෂණය ඉහත වගුවේ සඳහන් දින දක්වා වලංගු විය යුතුය.
8. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2026.05.21 වන දින පෙ.ව.10.00 ට පහත ලිපිනයේ ඇති පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උතුරු මැද පළාත ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ.
9. මෙම ප්‍රසම්පාදනය පිළිබඳව අවසාන තීරණය උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති / සාමාන්‍යාධිකාරී,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**එච්. බී. සේමසිංහ මාවත,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (උ.මැ.ප.),**
**අනුරාධපුර.**
**දුරකථන අංකය : 025 - 2222505**

CamScanner